# මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය
# MALIYADEVA COLLEGE OLD BOYS ASSOCIATION


මීගමු පාර, කුරුණෑගල, ශ්‍රී ලංකා
Negombo Road, Kurunegala, Sri Lanka.
WhatsApp : +94 76 837 6005

Telephone : +94 37 22 20 185 I +94 37 22 25 185
E-mail : devansoba@gmail.com
Web : www.maliyadevaoba.lk


2025/08/30
සියලුම සාමාජික සොයුරන් වෙත
හිතවත් සොයුර

**<u>මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ 87 වන සංවත්සරික මහා සභා රැස්වීම</u>**

**අප ආදි ශිෂ්‍ය සංගමයේ සංවත්සරික මහා සභා රැස්වීම සඳහා සහභාගී වන ලෙස ඉතා ගෞරවයෙන් මෙයින් ආරාධනා කර සිටිමු.**

➢ **ආදි ශිෂ්‍ය සංගමයේ සංවත්සරික මහා සභා රැස්වීම**

2025 සැප්තැම්බර් මස 21 වන ඉරිදා දින පෙ.ව. 10.00ට මලියදේව විද්‍යාලයීය නැකැත්තේ ආනන්ද අනුස්මරණ ආදි ශිෂ්‍ය ශ්‍රවණාගාරයේදී ගරු ක්‍රියාකාරි සභාපති සමන් ජයසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. එදින 7.30 සිට මහ සභාව සඳහා ලියාපදිංචිය සිදු කරනු ලැබේ.

➢ **<u>යෝජනා හා අදහස්</u>**

ව්‍යවස්ථාවේ 4.3. ඡේදයට අනුකූලව මහා සභාවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබන යෝජනා සහ කෘත්‍යාධිකාරී මණ්ඩලයෙන් ඇසීමට බලාපොරොත්තු වන ප්‍රශ්න හා විමසීම් 2025.09.10 වන බදාදා දිනට පෙර ගරු සමලේකම් වෙත ලිඛිතව දැන්විය යුතුයි.

➢ **නිලධාරීන් පත් කිරීම**

මලියදේව විද්‍යාලයීය ආදි ශිෂය සංගමයේ ව්‍යවස්ථාවේ නාම යෝජනා පත්‍ර කැඳවීම සහ නිලවරණය පැවැත්වීමේ අංක 7 ඡේදයට අනුකූලව කැඳවනු ලැබේ. ඔබ ආදි ශිෂ්‍ය සංගමයේ එකී තනතුරක් සඳහා පත්වීමට අදහස් කරන්නේ නම් එම තනතුර සඳහා නාම යෝජනා පත්‍රයක් ආදි ශිෂ්‍ය සංගම් කාර්යාලයෙන් හෝ අපගේ නිල වෙබ් අඩවිය හරහා බාගත කරගෙන **2025 සැප්තැම්බර් මස 10** වන බදාදා දින ප.ව. 2.00ට පෙර ගරු සම ලේකම් වෙත **අතින් ගෙනැවිත් භාරදීමෙන් , <u>WhatsApp (076 837 6005) මගින්  සහ Email</u>** <u>(devansoba@gmail.com)</u> **<u>මගින්</u>** එවිය යුතුය. එදින ප.ව.2.00 ට පසු ලැබෙන **<u>නාම යෝජනා</u>** පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2025 අගෝස්තු 30 දින පැවති 13 වන කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී තීරණය කල පරිදි මෙවර නිලවරණය **2025 සැප්තැම්බර් මස** 21 වන දින පෙ.ව.8.00 සිට පෙ.ව.10.30 දක්වා පැවැත්වේ. ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව එදින පෙ.ව 10.30න් පසු ඡන්ද ගණන් කිරීමේ නිලධාරීන් ඡන්ද ගණනය කර එහි ප්‍රතිඵල නිලධාරීන් පත් කරන අවස්ථාවේදී ප්‍රකාශයට පත් කරනු ලැබේ.

➢ වැදගත් :-

- **මහා සභාවට පැමිණෙන විට යාවජීව සාමාජික කාඩ්පත සහ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.**
- **ආදි ශිෂ්‍ය සංගමයේ නව ව්‍යවස්ථාව ආදි ශිෂ්‍ය සංගම් කාර්යාලයෙන් හෝ නිල වෙබ් අඩවියේන් බා ගත හැක.**
- **වාර්ෂික ගිණුම වාර්තාව 2025/09/08 දිනෙන් පසුව ආදි ශිෂ්‍ය සංගම් කාර්යයාලයෙන් ලබා ගත හැක.**
- **87 වන සංවත්සරික මහා සභා රැස්වීමට ප්‍රථම සියලුම අනුකණ්ඩායම් සහ සියලුම අනුබද්ධ ආයතන මලියදේව විද්‍යාලය ආදි ශිෂ්‍ය සංගමයේ 2025/26 වර්ෂයේ කාරක සභාව සඳහා නියෝජිතයා නම් කර එවන මෙන් කාරුණිකව දන්වා සිටිමි.**
- ආදි ශිෂ්‍ය සංගම් කාර්යාලය පෝය, ඉරිදා සහ ප්‍රසිද්ධ නිවාඩු දින හැර සතියේ සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව.8.30 සිට ප.ව.4.00 දක්වාත් සෙනසුරාදා දින පෙ.ව.8.30 සිට ප.ව.1.00 දක්වාත් විවෘතව ඇත.

➢ **පරිත්‍යාග සහ අනෙකුත් විමසීම්**

- ශිෂ්‍යත්ව/ව්‍යාපෘති/අරමුදල් සඳහා වන ඔබගේ පරිත්‍යාග, ගරු භාණ්ඩාගාරික අසංක වික්‍රමරත්න මහතාට (077 779 2994) ලබා දී ලදුපතක් ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිමු. (අරමුදල් තැන්පතු Sampath Bank - 1006 6100 6654 දරණ ගිණුමට ගිණුම්ගත කර තැන්පතු පත ආදි ශිෂ්‍ය සංගම් කාර්යයාලයට ඉදිරිපත් කර ලදු පතක් ලබා ගන්න)
- අනෙකුත් සියලුම විමසීම් සඳහා ගරු ක්‍රියාකාරි සභාපති සමන් ජයසිංහ (077 728 5500) සහ ගරු සමලේකම් ඩුලිප් වීරතුංග මහතා

(077 362 2516) අමතන ලෙස ඉල්ලා සිටිමු. (ආදි ශිෂ්‍ය සංගමයේ නිල WhatsApp අංකය - 076 837 6005 / Email- devansoba@gmail.com)

ස්තුතියි,
මෙයට විශ්වාසී,

සමන් ජයසිංහ
ගරු ක්‍රියාකාරි සභාපති
මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය
කුරුණෑගල.

.................................
සමන් ජයසිංහ
ක්‍රියාකාරි සභාපති
මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය

ඩුලිප් වීරතුංග/සරත් රත්නායක
ගරු සමලේකම්වරු
මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය
කුරුණෑගල.

.................................
ඩුලිප් වීරතුංග,ආර්.එම්.එස්.ආර්.රත්නායක
සමලේකම්වරු
මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය